Monday 07th September 2020 ISSUE - 30

# GoodSport NEWS

SRI LANKA OLYMPIC WEEKLY NEWS BULLETIN

NOC SL News

## FFSL President's Cup 2020




## Marauding Colombo FC unstoppable; route Blue Eagles 4-0

It was Colombo FC's who robbed all the glitter off the Sugathadasa Stadium skies (if there were any stars glittering) when they routed Blue Eagles SC 4-0 to emerge champions in the Vantage FFSL President's Cup 2020 tournament in a one-sided final played under lights, giving the sparse permitted crowed their money's worth.

After enjoying a slender 1-0 lead at half time, Colombo FC completely dominated the second session tactically outplaying the Blue Eagles by stepping up the tempo's winning the aerial battle and acclimatizing better to the wet conditions underfoot.

Ahmed Shazny was Colombo FC's hero scoring a brace either side of the interval including the opening goal in the 31st minute. The match was played at a fast and furious pace from the opening whistle though the ball was more seen in flight than being passed on the ground. Blue Eagles pressed hard for the equaliser but were denied by the Colombo FC custodian Imran Nazeer.

Continued on Page 02

IOC NEWS

## IOC EXECUTIVE BOARD MEETING

### INFORMATION FOR THE MEDIA

*The International Olympic Committee executive board (eb) will meet remotely by vedieo conferance through a seure electronic system on Wednsday 9 Septemtember 2020. The EB is scheduled to receive updates on the activities of the IOC administration and reports from the Organising Committees. The IOC will be holding a video teleconference open to the media with the IOC President at the end of the meeting.*

***Date:** Wednesday 9 September*
*Time: 12 – 3 p.m. CEST (EB meeting) / 4 p.m. CEST TBC* (media teleconference)*

***All media are welcome: Please pre-register via https://primetime.bluejeans.com/a2m/register/vrgcjexf to receive the link to the IOC President's video conference.***

## NOC NEWS



From Page 01

"We gave a good fight. We tried hard to get the equaliser but were unlucky. I have complete faith in my team though they made a few mistakes. We were outplayed in the second half and the better team on the day won," a disappointed Colombo FC skipper Lakmal Gunasinghe said after the match.

"I was confident that we would win and avenge the 2-0 loss in the group match," said winning Colombo FC skipper Chamith Rathnayake.

"We were in control throughout the match. Shazny has scored many goals for us and rose to the occasion in the final as well."

Blue Eagles seemed deflated after Furic Momas chested the ball and volleyed home a cross in the second half. Shazny scored from close range in 82nd minute while Shabeer Razooniya put the icing on the cake by pouncing on a defensive lapse and curling his shot in the far corner of the net shortly before added time.

Meanwhile Amir Alaric the FFSL's new national coach said "I am on the lookout for the real talent in Sri Lankan football.

I have been at this programme since I took over reins prior to the covid-19 break and I formed a young squad mainly consisting players in the ages ranging from 20-23 with an eye to make the base for the future international engagements especially the next South Asian Games and I am glad that this has made a good impact in this year's FFSL President's cup.

> *" Blue Eagles seemed deflated after Furic Momas chested the ball and volleyed home a cross in the second half."*





Continued on Page 03



## NOC NEWS



From Page 02



Colombo FC's Mohamed Fazal was adjudged the Most Valuable Player of the Final while New Youngs FC, Wennappuwa received the Fairplay award.


Former FFSL president Rear Admiral (Rtd) Sarath Weerasekara, the State Minister of Provincial Councils and Local Government, was the chief guest and gave away the trophy to the champions Colombo FC who also received Rs. 300,000 as prize money.



# මැරතන් - පාපැදි - ඇවිදීමේ තරග ඔක්තෝබර් 10-11

ජාතික මහ ක්‍රීඩා උළෙලේ මැරතන්, පාපැදි, ඇවිදීමේ (කාන්තා - පිරිමි) තරග මාලාව ලබන ඔක්තෝබර් 10-11 දෙදින කතරගමදී පැවැත්වීමට ක්‍රීඩා අමාත්‍යාංශය තීරණය කර තිබේ.

මෙවර තරග මාලාවන් විවෘත තරගමාලා- වක් ලෙස පැවැත්වීමට ක්‍රීඩා අමාත්‍යාංශය තීරණය කර තිබේ. එසේ වුවත් ලබන - වසරේදී පටන් නැවත මෙම තරග මාලාව කලින් පැවැත්වූ ආකාරයට පළාත්වලින් නිර්දේශ මත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වීමට තීරණය කර තිබෙන බව ක්‍රීඩා අධ්‍යක්ෂ අයි.පී. විජේරත්න මහතා පවසයි.



අත්හදාබැලීමක් ලෙස මෙම තරග මාලාව පසුගිය වසරේදී විවෘත තරග මාලාවක් ලෙස පැවැත්වීමට ක්‍රීඩා අමාත්‍යාංශය කටයුතු කළේය. එහෙත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් මුහුණදී තිබෙන ඇතැම් ගැටළු කෙරෙහි අවධානය යොමුකරමින් තරගාවලිය මෙම වසරේ පටන් පළාත්වලින් නිර්දේශ කෙරෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වීමට තීරණය කෙරිණ.

එහෙත් කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ එය මෙම වසරේදීත් විවෘත ඉසව් මාලාවක් ලෙස පැවැත්වීමට තීරණය කළ බව විරේරත්න මහතා පවසයි.

විවෘත තරග මාලාවක් ලෙස පැවැත්වුණත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් අයදුම්පත් යොමු කළයුත්තේ පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂවරයා බාරයේ බව ඔහු පවසයි. ඒ සඳහා ලබන සැප්තැම්බර් 30 වැනිදා දක්වා ඔවුන්ට අව- ස්ථාව හිමිව තිබේ.

කොවිඩ් තත්ත්වය හේතුවෙන් එහි ඇතැම් ක්‍රීඩා ඉසව් ඉවත්කිරීම සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගැනීම ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා සමග පැවැත්වෙන විශේෂ සාකච්ඡාවේදී තීරණය කිරීමට නියමිතය.

ජාතික මහ ක්‍රීඩා උළෙලේ මලල ක්‍රීඩා තරගාවලිය මෙවර දෙසැම්බර් තෙවැනි සතියේදී පැවැත්වෙන්නේ කොළඹ සුගතදාස පිටියේදීය. අවසන් වරට වසර 2012 දී ජාතික මහ ක්‍රීඩා උළෙල කොළඹ සුගතදාස පිටියේදී පවත්වා තිබේ.

පසුගිය වසරේදී එය පැවැත්වුණේ බදුල්ල වින්සන්ට් ඩයස් පිටියේදීය. ස්ටෑන්ඩ් පාපැදි ක්‍රීඩා ඉසව්ව වසර කීපයකට පෙර සිට ක්‍රීඩා උළෙලෙන් ඉවත්කර තිබේ.

46 වැනි ජාතික මහ ක්‍රීඩා උළෙලේ මැරතන්, ඇවිදීම, පාපැදි තරග මාලාව පැවැත්වෙන ආකාරය

**(ඔක්තෝබර් 10)**

- පෙරවරු 5.30* ඇවිදීම - කාන්තා හා පිරිමි තරග

- පෙරවරු 8.00* පාපැදි (පිරිමි - රේසින්) තරගය

- පෙරවරු 8.30* පාපැදි (කාන්තා - රේසින්) තරගය

**(ඔක්තෝබර් 11)**

- පෙරවරු 5.30* මැරතන් (කාන්තා - පිරිමි) තරග

**(නාමල් පතිරගේ)**
**ලංකාදීප කෙලි මඩල ඇසුරිනි**







# අධ්‍යාපන - සෞඛ්‍ය නිලධාරීහු අවදානම අනුව ක්‍රීඩා වෙන්කරති

පාසල් ක්‍රීඩා තරග ආරම්භ කිරීමේ මූලික පියවරක් ලෙස අධ්‍යාපන සහ සෞඛ්‍ය යන අමාත්‍යාංශවල නිලධාරීන්ගෙන් යුත් කමිටුව ක්‍රීඩා අවදානම අනුව කොටස් තුනකට වෙන් කිරීමට පියවර ගෙන තිබේ. ඉහළ අවදානම, මාධ්‍යම අවදා- නමක් සහ අඩු අවදානමක් සහිත ලෙස ක්‍රීඩා වෙන්කර ක්‍රීඩාවෙන් ක්‍රීඩාවට වෙන වෙනම සෞඛ්‍ය නිර්දේශ ලබාදීමට නියමිතය.

පාසල් ක්‍රීඩා තරග නැවත ආරම්භ කිරීමේ හැකියාව පිළිබඳ තීරණය කිරීමට පසුගියදා පැවැති සාකච්ඡාවකදී අධ්‍යාපන අමාත්‍යාංශ- යේ නිලධාරීන් ඉහත ආකාරයට ක්‍රීඩා වෙන්කර සෞඛ්‍ය බලධාරීන්ට යොමු කර තිබේ. 'කොවිඩ් 19' අවදානම හේතුවෙන් පසුගිය මාර්තු මස සිට මේ දක්වා කිසිඳු පාසල් ක්‍රීඩාවක් ආරම්භ කිරීමේ අවස්ථාවක් හිමිව නොමැත.

> **“ වසංගත තත්ත්වයෙන් ආරක්ෂාවීමට මුල්තැන දෙන්න සිදුවුණා. ඒ හේතුවෙන් ඇතැම් ක්‍රීඩාවල දැඩි අවදානම පිළිබඳව අවදානය යොමු කර අත්හැර දාන්න සිදුවුණා. ”**




මෙම සාකච්ඡාව පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් නිලධාරියකුගෙන් කළ විමසුමකදී පැවසුවේ මේ වන විටත් සෞඛ්‍ය බලධාරීන් නිර්දේශ සකස් කර ඇති බවත් ඉදිරි දින දෙක තුන තුළදී නිර්දේශ ප්‍රසිද්ධ කළ හැකි බවයි. “මෙහිදී අපිට වසංගත තත්ත්වයෙන් ආරක්ෂාවීමට මුල්තැන දෙන්න සිදුවුණා. ඒ හේතුවෙන් ඇතැම් ක්‍රීඩාවල දැඩි අවදානම පිළිබඳව අවදානය යොමු කර අත්හැර දාන්න සිදුවුණා.

උදාරණයක් ලෙස රග්බි ක්‍රීඩාව දැඩි අවදා- නමක් ක්‍රීඩාවක් නිසා අත්හිටුවන්න සිදුවුණා”

“කරාටේ ක්‍රීඩාව ගත්තොත් කාතා වැනි ඉසව් පවත්වන්න පුළුවන්. නමුත් කුමිතේ එනම් සටන් ඉසව් අත්හිටුවන්න සිදුවුණා. ජීවිතාරක්ෂක ක්‍රීඩා අපි දැඩි අවදානම් ගොඩට දැම්මට එහි ඇතැම් ඉසව් තියෙනවා දුරස්ථභාවය තබාගෙන කළ හැකි. ඒ නිසා එහි සංශෝධනයක් කරනවා” යැයි එම නිලධාරියා වැඩි දුරටත් පැවසීය.

ඉදිරි සතියක හෝ දෙකක කාලය තුළ තෝරාගත් ක්‍රීඩා සහ ඇතැම් තෝරාගත් ඉසව් පැවැත්වීමේ හැකියාව ඇති බව අධ්‍යාපන අමාත්‍යංශය බලාපොරොත්තු වෙයි.

අධ්‍යාපන අමාත්‍යංශය යටතේ පාලනය වන පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක නොවන ක්‍රීඩා කීපයක් සඳහා ද අධ්‍යාපන බලධාරීන් ක්‍රීඩා අමාත්‍යංශයට උපදෙස් ලබාදී ඇති බව දැනගන්නට තිබේ.

තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යවරයාගේ ඉල්ලීමකට අනුව සෞඛ්‍ය අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මහත්මියගේ මැදිහත්වීමෙන් සෞඛ්‍ය බලධාරීහූ මේ සඳහා මැදිහත් වූහ.

**(යොහාන් භාසුර)**
**ලංකාදීප කෙලි මඩල ඇසුරිනි**

